| 03-02-2026 | උදෑසන මුරලි | ඕම් ශාන්ති | බාප්දාදා | මධුබන් |
|---|---|---|---|---|

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ අනිවාර්යෙන්ම සිහි කිරීම සඳහා උත්සාහ දැරිය යුතුයි. මන්ද, පාප ක්‍රියා දමනය කළ හැක්කේ ස්මරණ බලයෙන් පමණයි.

**ප්‍රශ්නය:** උත්සාහ දරමින් යන අතර කුමනාකාරයේ සිතිවිල්ලක් නිසාද ඔබ ඇද වැටෙන්නේ? පරමාත්ම දෙවියන්ගේ දරුවන් විසින් නොනවත්වාම කරගෙන යනු ලබන සේවාව කුමක්ද?

**පිළිතුර:** තවත් බොහෝ කාලයක් තිබෙනා නිසා තවත් ටිකක් කල් ගිහින් උත්සාහ දැරිය හැකියි කියා ඇතැම් දරුවන් සිතනවා. කෙසේවෙතත්, මාරයාට කිසිම විනයක් නොමැත. හෙට කිය කියා සිටියදී මාරයා පැමිණ ඔබව ගිල ගනීවි. එමනිසා, තවත් අවුරුදු ගණනාවක් තිබෙනා එකේ අවසානයේදී උත්සාහ දරා ඉදිරියට යා හැකියි කියා කිසි විටෙක සිතන්න එපා. මෙම සිතිවිල්ල ඔබව තව තවත් පහළට ඇද දමාවි. හැකි උපරිමයෙන්ම සිහි කිරීම සඳහා උත්සාහ දරා ශ්‍රීමත් පිළිපදිමින් තමන්ට යහපත සලසා ගන්න. පරමාත්ම දෙවියන්ගේ සහායකයින් වන ආධ්‍යාත්මික දරුවන් නොනවත්වාම ජීවාත්ම බීජ පැළ කළ යුතුයි.

**ගීතය:** ඕම් නමෝ ශිවාය...

ඕම් ශාන්ති. භෞතික කෙනාගෙන් තොරව අභෞතික පියාටද තම චරිත කොටස රඟ දැක්වීම සඳහා කිසිවක් කළ නොහැකි බව ඔය දරුවන්ට පැහැදිලි කර කියා දී තිබෙනවා. ආධ්‍යාත්මික පියා මෙහි පැමිණ ආධ්‍යාත්මික දරුවන්ට උගන්වන්නේ බ්‍රහ්මා හරහායි. ඔය දරුවන් යෝග බලයෙන් සතෝප්‍රධාන් වී සතෝප්‍රධාන් ලෝකයේ පාලකවරුන් විය යුතුයි. මෙය ඔය දරුවන්ගේ සිහියේ තිබෙනවා. පරමාත්ම පියා සෑම කල්පයකදීම ඔය දරුවන්ට ඉගරන්වීමට පැමිණෙනවා. ඔහු බ්‍රහ්මා හරහා ආදි සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපනය කර සාමාන්‍ය මනුෂ්‍යයින්ව දේවතාවරුන් කරවනවා. දේවතාවරුන් ලෙස සිටි මිනිසුන් දැන් අපිරිසිඳු ශුද්‍රයින් බවට පත් වෙලා. භාරතය දිව්‍යමය දේශයක්ව තිබුණු කල එහි පාරිශුද්ධත්වය, සාමය හා සතුට සියල්ලම තිබුණා. මෙය වසර 5000 ක කතාවක්. පරමාත්ම පියා මෙහි පැමිණ අසුන් ගෙන එහි සැබෑම ගණන ඔය දරුවන්ට කියා දෙනවා. ඔහුට වඩා ඉහළ කෙනෙක් තවත් නැහැ. ලෝකයේ මුල, මැද හා අග මෙන්ම කල්ප වෘක්ෂය පිළිබඳ වූ සෑම රහසක්ම ඔබට කියා දිය හැක්කේ පරමාත්ම පියාටම පමණයි. භාරතය පුරා දේවතා ධර්මයක් තිබුණා. දැන් එය අතුරුදන් වී ගිහින්. ඒ දේවතා ධර්මය දැන් තවදුරටත් නැහැ. දේවතාවරුන්ගේ ප්‍රතිමා නම් අනිවාර්යෙන්ම තිබෙනවා. ස්වර්ණමය යුගයේ ලක්ෂ්මී හා නාරායන රාජ්‍යය තිබුණු බව භාරත ජනයා දැන ගෙන සිටියා වුවත් ක්‍රිෂ්ණාව තඹ යුගයේ කෙනෙක් ලෙස පෙන්වීමෙන් ඔවුන් කර ඇත්තේ වැරැද්දකි. නිවැරදි මඟ අමතකව ඇති අයට නැවතත් මඟ පෙන්වා දෙන්නේ පරමාත්ම පියා පැමිණි විටම පමණයි. ඔබට මඟ පෙන්වන්නා මෙහි පැමිණි විට සෑම ජීවාත්මයක්ම මුක්ති දේශය කරා යනවා. මෙන්න මේ නිසා තමයි ඔහු සෑම දෙනාටම ගැලවීම ලබා දෙන්නා යයි කියන්නේ. ඇත්තේ එකම එක නිර්මාණකරුවෙක් හා එකම එක ලෝකයක් පමණයි. එකම එක ලෝකයක ඉතිහාසයක් හා භූගෝලයක් පමණයි ඇත්තේ. එය දිගින් දිගටම නොනවත්වා ගමන් කරනවා. ස්වර්ණමය, රිදී, තඹ හා කලි යුගත් සංගම යුගයත් තිබෙනවා. කලි යුගයේ අපිරිසිඳු ජීවාත්මයක් සිටිනා අතර ස්වර්ණමය යුගයේ සිටින්නේ පිරිසිඳු ජීවාත්මයනුයි. ස්වර්ණමය යුගය තිබුණු කල කලි යුගය අනිවාර්යෙන්ම විනාශ වී තිබෙන්න ඇති. ස්ථාපනය සිදු වූයේ විනාශයට පෙරයි. ස්වර්ණමය යුගයේදී ස්ථාපනය සිදු වන්නේ නැහැ. පරමාත්ම දෙවියන් පැමිණෙන්නේ ලෝකය අපිරිසිඳු වුණු විට පමණයි. ස්වර්ණමය යුගය පාරිශුද්ධ ලෝකයයි. අපිරිසිඳු ලෝකය පිරිසිඳු කිරීමට පරමාත්ම දෙවියන් පැමිණිය යුතුයි. පරමාත්ම පියා දැන් ඔබට පහසුම මඟ පෙන්වා දෙනවා : සෑම ශාරීරික සබඳතාවයක්ම අතහැර දමා ජීවාත්ම අවධානයට පැමිණ පරමාත්ම පියාව සිහි කරන්න. කවුරු හෝ කෙනෙක් පාරිශුද්ධකරු විය යුතුයි. බැතිමතුන්ට ඔවුන්ගේ භක්තියේ ඵලය දෙන්නේ පරමාත්ම දෙවියන් පමණයි. ඔහු භක්තිවන්තයින්ට ඥානය දෙනවා. ඥාන සාගරය අපිරිසිඳු ලෝකයට පමණක් පැමිණෙන්නේ ඔබලාව පාරිශුද්ධ කරවීමටයි. ඔබ පාරිශුද්ධ වන්නේ යෝගාවෙනි. පරමාත්ම පියාම හැරෙන්න වෙන කිසිම කෙනෙකුට ඔබව පාරිශුද්ධ කරවන්න බැහැ. මේ සෑම කරුණක්ම ඔබගේ සිහියේ රඳවන්නේ පසුව ඔබට ඒවා අන් අයට පැහැදිලි කර කියා දිය හැකි නිසායි. සෑම නිවසකටම පණිවිඩය දිය යුතුයි. දෙවියන් ඇවිල්ලා කියා කෙළින්ම කියන්න එපා. ඉතාමත් උපක්‍රමශීලීව පැහැදිලි කළ යුතුයි. ඔවුන්ට කියන්න: ඔහු තමයි පරමාත්ම පියා. එහෙම නේද? එක්

අයෙක් ඔබගේ ලෞකික පියා වන අතර අනික් කෙනා මෙම ලෝකයෙන් එහා සිටින පරමාත්ම පියායි. දුකින් සිටිනා විට සෑම කෙනෙක්ම එලොවින් සිටිනා පරමාත්ම පියාව සිහි කරනවා. කිසිම කෙනෙක් සතුටු දේශයේදී ඔහුව සිහි කරන්නේ නැහැ. ස්වර්ණමය යුගයේදී ලක්ෂ්මී නාරායන රාජ්‍යයේ ඇත්තේ වෙන කිසිම දෙයක් නොව සතුටමයි: පාරිශුද්ධත්වය, සාමය හා සෞභාග්‍යය තම උරුමය තමාට හිමි වුණු පසු ඔහුට කන්නලව් කළ යුත්තේ ඇයි? තමාට සතුට ලැබී ඇති බව ජීවාත්මයන් දන්නවා. එහි ඇත්තේ වෙන කිසිවක්ම නොව සතුටමයි කියා ඕනෑම කෙනෙක්ට කිව හැකියි. පරමාත්ම පියා දුකින් පිරි ලොවක් නිර්මාණය කරන්නේ නැහැ. මේ නාටකය කල් තබාම තීරණය වූවකි. අවසානයේදී උපත් දෙක තුනක් පමණක් ඇති අය ඉතිරි කාලයම සාමයේ සැතපෙන්නෝ වෙති. කෙසේ වෙතත් මෙම කල් තබාම තීරණය වුණු නාටකයෙන් පිටතට පැමිණීම කිසිම කෙනෙක්ට කළ නොහැක්කක්. මෙම නාටකයේ රඟපෑමට සෑම කෙනෙක්ම මෙහි පැමිණිය යුතුයි. උපත් දෙක තුනක් පමණක් ඇත්තන්ට ඉතිරි මුළු කාලයම සදාකාලික මුක්තිය වගේ තමයි දැනෙන්නේ. ජීවාත්මයන් නළුවන්ය. ඇතැම් ජීවාත්මයන්ට උසස් චරිත ලැබෙනා අතර අනිත් අය ලබන්නේ ඊට වඩා අඩු තත්ත්වයේ චරිත කොටස් ය. ඔබට මෙය දැන් වැටහෙනවා. දෙවියන්ගේ අගටම කිසිම කෙනෙක්ට යා නොහැකියි කියා සඳහන් කර තිබෙනවා. නිර්මාණකරුත්, නිර්මාණයේ මුල, මැද හා අග ගැනත් කියා දිය හැක්කේ පරමාත්ම පියාටම පමණි. තමන් සාමාන්‍ය ශරීරයකට ඇතුළු වෙනවායි කියා ඔබට කියන්නේත් පරමාත්ම පියා පැමිණි විටම පමණයි. මම ඇතුළු වෙන ශරීරයේ කෙනාවත් තමන්ගේ උපත් ගැන දන්නේ නැහැ. මම මෙහි සිට උපත් 84 කතාව ඔහුට කියා දෙනවා. කිසිම කෙනෙකුගේ චරිත කොටසේ කිසිම වෙනසක් සිදු වෙන්න බැහැ. මෙය කල් තබාම තීරණය වුණු නාටකයකි. මෙම කරුණවත් කිසිම කෙනෙකුගේ සිහියේ රැඳෙන්නේ නැහැ. පිරිසිදු බුද්ධියකින් යමක් තේරුම් ගැනීමට උත්සාහ කළහොත් පමණයි මෙය තේරුම් ගත හැක්කේ. දින හතේ බතිය ඔබට සියල්ලම ඉතාමත් පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයේ එකක්. හගවතය දින හතක් තිස්සේ කියවනවා. මෙහිදීත් දින හතක් පුරා පැමිණියේ නැතිනම් කිසිම කෙනෙකුට කිසිම දෙයක් තේරුම් ගත නොහැකි බව ඔබ දන්නවා. දින හතෙන් පසුවත් ඇතැම් අය ඉතාමත් හොඳින් සියල්ල තේරුම් ගන්නා අතර අනිත් අයට කිසිවක්ම තේරෙන්නේ නැහැ. සරලවම එය ඔවුන්ගේ බුද්ධියට ඇතුළු වන්නේ නැහැ. දින හතක් තිස්සේ මම ආවා. නමුත් මට නම් කිසිම දෙයක් තේරෙන්නේ නැහැයි කියා ඔවුන් කියාවි. උසස් තත්ත්වයක් දිනා ගැනීමට ඔවුනට නැතිනම් එය ඔවුන්ගේ බුද්ධියේ පතිත වන්නේ නැහැ. හොඳයි, කුමන හෝ යහපතක් ඔවුන් ලබා ගන්න ඇති. පුරවැසියන් බිහි වන්නේ මේ ලෙසිනුයි. කොහොම නමුත් රාජධානියක වාසනාව දිනාගැනීමට නම් කාටවත් නොපෙනෙන උත්සාහයක් දැරීම අත්‍යාවශ්‍ය වෙනවා. පරමාත්ම පියාව සිහි කිරීමෙන් පමණයි. ඔබගේ පාප දුරු වී යන්නේ. ඔබ මේවා පිළිපැද්දත් නැතත් මේ සියල්ල පරමාත්ම පියාගේ උපදේශයනුයි. තමන් ආදරය කරනා කෙනෙක්ව ඔබ සෑම විටම සිහි කරනවා. භක්ති මාර්ගයේදී මිනිස්සු : අහෝ පාරිශුද්ධකරුවාණෙනි, වඩිනු මැනව කියා කන්නලව් කළා. දැන් ඔබට ඔහුව මුණ ගැසී තිබෙනවා. ඔහු කියනවා : මා සිහි කරන්න. ඔබගේ මලකඩ සියල්ල ඉවත් වී යාවි. රාජ්‍යයක් දිනා ගැනීම එතරම්ම පහසු දෙයක් නොවෙයි. යම් උත්සාහයක් දැරිය යුතුයි. උත්සාහය අවශ්‍ය වන්නේ ස්මරණයටයි. ප්‍රධානම දෙය ස්මරණ වන්දනාවයි. ඉතාමත් හොඳින් සිහි කරන්නන් තම කර්මතීත් තත්ත්වයට පත් වෙනවා. පූර්ණ සිහි කිරීමක නොසිටියහොත් ඔබගේ පාප දුරු වී යන්නේ නැහැ. පාප දමනය කළ අයෙක් බවට පත් විය හැක්කේ යෝග බලයෙනි. මීට පෙරත් ඔබ පාප ජය ගත්තේ යෝග බලයෙනි. කලි යුගය අවසානයේ එකම එක පාරිශුද්ධ ජීවයක්වත් නොමැති කල ලක්ෂ්මී හා නාරායන් එතරම් පාරිශුද්ධ වූයේ කෙසේද? ගීතා වෙළුම දැන් නැවතත් දිග හැරෙමින් පවතින බව පැහැදිලිව ලියා තිබෙනවා. ශිව පරමාත්මය කියන්නේ: වැරදීම් දිගටම සිදු වෙනවා. පරමාත්ම පියා පැමිණ ඔබව වැරදි කිරීමෙන් මුදවා ගන්නේ. භාරතයේ සෑම ග්‍රන්ථයක්ම භක්ති මාර්ගයට අදාල ඒවායි. පරමාත්ම පියා කියනවා : මීට පෙර මා කිව්වෙ මොනවාදැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. මේ සියල්ල ඇසූ අය යම් තත්ත්වයක් ලබා ගත්තා. උපත් 21 ක උරුමය ඔවුන් දිනා ගැනීමෙන් අනතුරුව ඥානය අතුරුදන් වුණා. චක්‍රය වටා ගිය පිරිස ඔබලායි. මීට පෙර කල්පයේදීත් මේ දේ වලට ඇහුම් කන් දුන් අය පමණයි නැවතත් පැමිණෙන්නේ. මිනිසුන් දේවතාවරුන් බවට පත් කරවීමේ බීජය ඔබ දැන් රෝපණය කරමින් සිටිනා බව ඔබලා දන්නවා. මේ ඒ දේවතා ගසෙහි පැළයමයි. ඒ මිනිස්සු නොයෙකුත් රුක් රෝපණ කරනවා. පරමාත්ම පියා පැමිණ ඔබට මේ දෙක අතර වෙනස පහදා දෙනවා. පරමාත්ම පියා පැළ කරන්නේ දේවතා මල් පැළයයි. ඒ අය දිගටම කරන්නේ කැලෑ වලට ගස් සිටුවීමයි. කෞරවයින් කරන්නේ මොනවාද, පාන්ඩවයින් කරන්නේ මොනවාදැයි කියා ඔබලාට පෙන්වා දී තිබෙනවා. ඔවුන්ගේ සැලසුම් මොනවාද, ඔබලාගේ සැලසුම් මොනවාද? ලෝක ජනගහනය වැඩි වීම වැලැක්වීමට ඔවුන් කටයුතු සැලසුම් කරනවා. ජනගහනය වැඩි නොවීමට පවුල් සැලසුම් ක්‍රම අනුගමනය

කරනවා. ඒ සඳහා ඔවුන් මහත් වෙහෙස මහන්සි වී වැඩ කරනවා. පරමාත්ම පියා ඔබට ඉතාමත් හොඳ දේවල් කියනවා: දේවතා ධර්මයේ එකම එක පවුල ස්ථාපනය වී අන් සියළුම ආගම් විනාශ වී යාවි. ස්වර්ණමය යුගයේ තිබුණේ ආදි සනාතන දේවතාවරුන්ගේ එකම එක පවුල පමණයි. ඒ කාලයේ පවුල් ගණනාවක් තිබුණේ නැහැ. භාරතයේ විවිධාකාර පවුල් වර්ග තිබුණා. ගුජරාති පවුල්, මහාරාෂ්ට්‍ර පවුල්. ඇත්ත වශයෙන්ම කියනවා නම් තිබිය යුත්තේ භාරතවාසීන්ගේ එකම එක පවුල පමණයි. පවුල් කිහිපයක් ඇති විට අනිවාර්යෙන්ම එකිනෙකා අතර ආරවුල් ඇති වෙනවා. සිවිල් යුද්ධත් ඇති වෙනවා. පවුල් අතරත් සිවිල් යුද්ධ ඇති වෙනවා. ක්‍රිස්තියානුවන්ට ඔවුන්ටම කියා පවුලක් තිබෙනවා. ඔවුන් එකිනෙකා අතරත් සිවිල් යුද්ධ ඇති වෙනවා. එකම පවුලේ සහෝදරයින් දෙදෙනෙක් එකිනෙකාව මුණ ගැසෙන්නේවත් නැතිව ජීවත් වෙමින් වතුර පොදට පවා දබර වෙනවා. සීක් ධර්මයේ අය සෑම විටම උත්සාහ කරන්නේ තම සීක් ධර්මයේ අයට වැඩි සතුටක් දීමටයි. ඒ රඟුනින් ඔවුන්ව ඇදෙනා නිසා ඒ වෙනුවෙන් වෙහෙස වෙනවා. අවසාන කාලයේදී සිවිල් යුද්ධ ආදිය ඇති විය හැකියි. ඔවුන් එකිනෙකා අතර රණ්ඩු සරුවල් ඇති වේවි. විනාශය සිදු විය යුතුයි. ඔවුන් බෝම්බ ගණනාවක් සාදනවා. මහා යුද්ධයේදී බෝම්බ දෙකක් බිම හෙලුවා. දැන් ඒ ගණනාවක් සාදා තිබෙනවා. මෙය අවබෝධ කර ගත යුතු කරුණක්. මේ එම මහා භාරත යුද්ධයම බව ඔබ පැහැදිලි කළ යුතුයි. මේ යුද්ධය අවසන් කළේ නැතිනම් මුළු ලෝකයම ගිණිබත් වේවි කියා සියලුම ප්‍රභූවරුන් පවා කියනවා. ලෝකය ගිණිබත් වන බව ඔබලා දන්නවා. පරමාත්ම පියා ආදි සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපනය කරනවා. මේ රාජයෝගාව ස්වර්ණමය යුගය සඳහායි. ඒ දේවතා ධර්මය දැන් අතුරුදන් වෙලා. එහි ප්‍රතිමා රැසකුත් නිර්මාණය වී තිබෙනවා. පරමාත්ම පියා කියනවා. මීට පෙර කල්පයේ ඇති වුණු බාධක සියල්ලම ඒ ආකාරයෙන්ම නැවතත් ඉස්මතු වේවි. මුලදී ඔබ මේ ගැන දැනගෙන සිටියේ නැහැ. පෙර කල්පයේදීත් එය ඒ ආකාරයෙන්ම සිදු වුණු බව ඔබට තේරුණා. මේ නාටකය කල් තබාම තීරණය වූවක්. අපි මෙම නාටකයට බැඳිලා සිටිනවා. ස්මරණ වන්දනාව අමතක නොකළ යුතුයි. මෙය පරීක්ෂණයක් පමණයි. ස්මරණ වන්දනාවේ ඔබ නිසි ලෙස සිටිය නොහැක්කේත් වෙහෙසට පත්ව ඇති නිසායි. රාත්‍රියේ සංචාරය කරන්නාණනි, වෙහෙසට පත් නොවන්න කියා ගීතයකුත් තිබෙනවා. කිසිම කෙනෙක් මෙහි අර්ථය දන්නේ නැහැ. රාත්‍රිය අවසන් වී දවස උදා වන ස්මරණ වන්දනාව මෙයයි. කල්ප භාගයක් පිරුණු විට දුක ඇරඹෙනවා. පරමාත්ම පියා පමණයි ඔබට මන්මනාභව යන්නෙහි අරුත පැහැදිලි කර දෙන්නේ. ගීතාවේ ක්‍රිෂ්ණාගේ නම සඳහන් කර ඇති නිසා තවදුරටත් ශක්තියක් ඉතිරි වී නැහැ. දැන් සෑම කෙනෙක්ටම යහපත් කාලයක්. එනම් අපි සියලුම දෙනාට යහපත උදා කරනා බවයි. විශේෂයෙන්ම භාරතයත් පොදුවේ මුළු ලෝකයමත් යහපතක් ලබනවා. අපි ශ්‍රීමත් පිළිපැද සැමට යහපත උදා කර දෙන්නෙමු. කරුණාවන්ත වන අයට උරුමයක් හිමි වෙනවා. ස්මරණ වන්දනාවෙන් තොරව කිසිම යහපතක් සිදු වන්නේ නැහැ. ඔහු අසීමිත පියා බව ඔබට දැන් පැහැදිලි කර කියා දී තිබෙනවා. පරමාත්ම පියාගෙන් ඔබ ඔබගේ උරුමය හිමි කර ගත්තා. ඔය භාරතවාසීන් උපත් 84 ක් ගෙන තිබෙනවා. නැවත ඉපදීමුත් සිදු වෙනවා. උපත් 84 ක් ගන්නේ කවුදැයි කියා කිසිම කෙනෙකුට තේරෙන්නේ නැහැ. තම තමන්ගේ පාඨ ලිය ලියා කිය කියා සිටීම පමණයි ඔවුන් කරන්නේ. අපහාසාත්මක දේ රැසක් ලියා ඇති ඒ ගීතාවම තමයි මෙය. ඔවුන් ගීතාවට වඩා වැඩි වැදගත්කමක් දී ඇත්තේ භගවතයටයි. ගීතාවේ ඥානය ඇති අතර භගවතයේ ඇත්තේ ජීවන කතාන්දරයයි. ඇත්තෙන්ම කියනවා නම් වඩාත් වැදගත් වන්නේ ගීතාවයි. පරමාත්ම පියා ඥාන සාගරය වන අතර ඔහුගේ දැනුම දිගටම පැවතගෙන යනවා. ඔවුන් පැය භාගයකින් ගීතාව කියවා අවසන් කරනවා. ඔබ දැන් මෙය ලියා තබාගෙන පසුව අඛණ්ඩව දැනුමට ඇහුම්කන් දෙනවා. සෑම දිනකම මිනිස්සු ඔබ ළඟට පැමිණේවි. එක් එක් අය ටික ටික පැමිණේවි. ලොකු ලොකු රජවරුන් දැන්ම පැමිණියහොත් වැඩි කලක් යන එකක් නැහැ. ඉතාමත් ඉක්මනින් හඬ පැතිරේවි. මෙන්න මේ නිසා තමයි සියල්ල උපක්‍රමශීලීව හෙමින් සීරුවේ ක්‍රියාත්මක වෙන්නේ. මෙම දැනුම අදෘශ්‍යමානයි. අපි කරන්නේ කුමක්දැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. ඔබ රාවන සමග සටන් කරන්නේ කෙසේදැයි කියා ඔබම හැරෙන්න වෙන කිසිම කෙනෙක් දන්නේ නැහැ. පරමාත්ම දෙවියන් කියනවා : සතෝප්‍රධාන් වී සියලු පාපයන්ගෙන් දුරු වීමට නම් මා සිහි කරන්න. පාරිශුද්ධ වන්න. මා ඔබව මා සමඟ ගෙන යන්නේ එවිට පමණයි. ඔබ සෑම කෙනෙක්ම ජීවන මුක්තිය ලැබීමටයි සිටින්නේ. රාවන රාජ්‍යයෙන් මිදිය යුතුයි. බ්‍රහ්ම කුමර කුමරියන් වන අප ශිව් ශක්තීන්. පරමාත්ම පියා, පරමාත්ම ජීවයේ උපදෙස් වලට අනුව හරියටම වසර 5000 කට පෙර කළ ආකාරයෙන්ම උතුම් ලෝකය ස්ථාපනය කරන්නෙමු. වසර 5000 කට පෙර ලෝකය උසස්වට තිබුණා. මෙය ඔබගේ සිහියේ හොඳින් ධාරණය කර ගත යුතුයි. මෙම ප්‍රධාන කරුණු ඔබගේ සිහියේ ඇති විට පමණයි ඔබට ස්මරණ වන්දනාවේ සාර්ථකව නියැලිය හැකි වන්නේ. ගල් බුද්ධි ඇති අයත් සිටිනවා. තවත් කාලය ඇතැයි කියාත් සිතනා ඇතැම් අය උත්සාහයත්

පසුවට කල් දමනවා. නමුත් මාරයා යනු කිසිම විනයක් ඇත්තෙක් නොවෙයි. හෙට හෙට කිය කියා සිටියදී ඕනෑම කෙනෙක් හෙටම මිය යා හැකියි. ඔබ උත්සාහ දරා නොමැති නම් අවසානයේදී හොඳ උත්සාහයක් දරා ඉහළින් යා හැකියි කියා සිතා ගෙන ඉන්න එපා. මෙම සිතිවිල්ල ඔබව තවත් බිමට ඇද දමනු ඇත. හැකි උපරිමයෙන්ම උත්සාහ දරන්න. ඔබ සෑම කෙනෙක්ම ශ්‍රීමත් පිළිපැද තම තමන්ට යහපත සලසා ගත යුතුයි. තමාව පරීක්ෂා කර බැලිය යුතුයි. මම කෙතරම් දුරට පියාව සිහි කරනවාද? කෙතරම් දුරක සේවයක් කරනවාද? ඔබලා පරමාත්ම දෙවියන්ගේ ආධ්‍යාත්මික සහායකයින්ය. ඔබ ජීවාත්මයන්ව මුදවා ගන්නවා. අපිරිසිදු ජීවාත්ම පාරිශුද්ධ කරවීමේ මඟ ඔහු පෙන්වනවා. ලෝකයේ හොඳ හා නරක මිනිසුන් සිටිනවා. සෑම කෙනෙක්ටම ඒ ඒ අයට ආවේණික වූ චරිත කොටසක් තිබෙනවා. මෙය අසීමිත කරුණක්. ලොකු ශාඛා පමණයි ගණනයට ගැනෙන්නේ. නමුත් පත්‍ර රාශියක් තිබෙනවා. පරමාත්ම පියා කියනවා: දරුවනි, උත්සාහ දරන්න. සෑම කෙනෙකුටම පරමාත්ම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. එවිට ඔවුන්ගේ බුද්ධියේ යෝගාව පරමාත්ම පියා හා සම්බන්ධ වේවි. පරමාත්ම පියා සෑම දරුවෙකුටම කියන්නේ: පාරිශුද්ධ වන්න ඔබ මුක්ති දේශයට යාවි. මහා භාරත යුද්ධයෙන් සිදු වීමට යන්නේ කුමක්දැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. මෙම ඥාන යාගය නිර්මාණය වී ඇත්තේ නව ලෝකය සඳහායි. අපගේ මෙම යාගය අවසන් වීමත් සමඟ සියල්ලම එයට බිලි දෙනු ඇත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මෙම නාටකය කල් තබාම තීරණය වූවකි. එමනිසා, බාධක වලට බිය නොවන්න. බාධක නිසා ස්මරණ වන්දනා ගමන නතර නොකරන්න. ඔබගේ ස්මරණ වන්දනාව නතර කර නොගැනීමට වග බලා ගන්න.
2. එපිටින් සිටිනා පරමාත්ම පියාගේ හැඳින්වීම සැමට ලබා දී පාරිශුද්ධ වීමේ මඟ ඔවුන්ට පෙන්වා දෙන්න. දිව්‍යමය ගසෙහි පැළය පැළ කරන්න.

**වරදානය:** ඔබ අත්හැරීමේ ප්‍රතිරූපයක් සහ "මම" පිළිබඳ සියලු අවධානයන් අත්හරින ලද නිරන්තරයෙන් සේවයේම නිරතව සිටින සේවකයෙකු වේවා.

සේවකයෙකුට "මම" පිළිබඳ අවධානය අත්හැර දැමූ විට ඔහු කරන සේවයේ සාර්ථකත්වය අත්විඳීමට හැකි වනු ඇත. "මම සේවය කරනවා. මමයි මෙම සේවය කළේ". මෙවැනි සේවය කිරීමේ හැඟීම පවා අත්හරින්න. මම එය කළේ නැත, නමුත් මම කරන්හාර් (ක්‍රියා කරන කෙනෙක්) වන අතර පරමාත්ම පියා කරවන්හාර් (මාව ක්‍රියා කිරීමට සලස්වන කෙනා). "මම" පිළිබඳ අවධානය පරම පියාගේ සෙනෙහසේ ඒකාබද්ධ වීමට ඉඩ දෙන්න. මෙය සේවය කිරීමේම නිරන්තරයෙන් නිරත වීම, අත්හැරීමේ ප්‍රතිරූපයක් සහ සැබෑ සේවාධාරියෙකු වීම ලෙස හැඳින්වේ. ඒකායන තැනැත්තා මට එය කිරීමට සලස්වන අතර මම උපකරණයක් පමණි. සේවය කිරීම සමඟ මිශ්‍ර වූ "මම" පිළිබඳ අවධානය තිබීම යනු බැඳීම් ඇති වීමයි. සැබෑ සේවාධාරියෙකුට එම සංස්කාර නොමැත.

**පාඨය:** සියලු නාස්තිය අවසන් කරන්න, එවිට සේවා පිරිනැමීම් ඔබ ඉදිරියට එනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න.**

එකමුතුකම සඳහා, ඔබට ඉඩ දෙමින් හැඩ ගැසීමේ බලය අවශ්‍ය වේ, මෙය ඔබ සතුව තිබීමෙන්, අන් අයගේ සංස්කාර ද සිසිල් (මෘදු) වනු ඇත. සෙනෙහසේ සහ ශ්‍රේෂ්ඨත්වයේ හැඟීම් සමඟ එකිනෙකා සමඟ සම්බන්ධ වන්න. ගුණධර්ම අරගන්නා කෙනෙකු වන්න, එවිට සෑම විටම එකමුතුකම පැවතිය හැකිය. සමූහය වෙනුවෙන් වන ඔබේ සුබ පැතුම්, සියලු ජීවාත්මයන්ට මෙම නව මාවත සොයා ගැනීමට ඔවුන්ගේ හැඟීම් වල ඵල ලබා දීමේ දී උපකාරී වනු ඇත.